# දර්ශන

සත්ත්වයාත් ලෝකයත් එහි පැවැත්මත් පිළිබඳව ඒ ඒ බුද්ධිමතුන්ට පෙනුනු ආකාරය දර්ශනය නමින් හැඳින්විය හැකිය. එම දර්ශන ප්‍රධාන වශයෙන් **අපරදිග දර්ශන** සහ **පෙරදිග දර්ශන** යනුවෙන් කොටස් දෙකකට බෙදේ. එහිදී අපරදිග දර්ශනය **ඇරිස්ටෝටල්, ප්ලේටෝ, සොක්‍රටීස්, ඩිමොක්‍රිටීස්, පෛතගරස්** වැනි ග්‍රීක දාර්ශනිකයන්ගේ සංකල්ප අනුව විකාශය විය. ඒවා භෞතිකවාදය පදනම් වූ දර්ශන බැවින් ඒ අනුව **පරමාණු විද්‍යාව, ගණිත ශාස්ත්‍රය, තාරකා විද්‍යාව, විච්ඡේද විද්‍යාව, රසායන විද්‍යාව, තෘණ විද්‍යාව, සත්ත්ව විද්‍යාව, භූ විද්‍යාව** ආදි විවිධ අංශයන්වලින් ද **දේශපාලන විද්‍යාව, ආචාරධර්ම විද්‍යාව** වැනි කරුණුවලින් ද දියුණුවට පත් විය.

ග්‍රීක දාර්ශනිකයන්ගෙන් වැඩිදෙනෙක්ම ඊශ්වරවාදයත්, ආත්මවාදයත් පිළිගත්හ. එහිදී **ඇරිස්ටෝටල්** නමැති දාර්ශනිකයා ශරීර විනාශයෙන් ආත්මය වෙන්වූ විට පවිත්‍රීකරණයත්, සත්‍යයේ ඥානයත් ලැබෙතැයි ද, **සොක්‍රටීස්** ආත්මය ශරීරයෙන් ශරීරයට සංක්‍රමණය වෙමින් අවසන්හි දෙවියන් වහන්සේ වෙත ගිය විට සත්‍යඥානය ලැබෙතැයි ද, **ඩිමොක්‍රිටීස්** ආත්මය පරමාණුවලින් සෑදී ඇති බැවින් පරමාණුව නිත්‍ය මෙන්ම ආත්මය ද නිත්‍යයැයි ද, **පෛතගරස්** නමැත්තා දෙවියන් වහන්සේ ලෝකය මවා ඇති හෙයින් ආත්මය ද දෙවියන්ගේ කැමැත්ත අනුව සිදුවෙතැයි ද කීහ. මොවුන් අතුරින් ඇරිස්ටෝටල් සහ ප්ලේටෝ දේශපාලන විද්‍යාවත් ඩිමොක්‍රිටස් නවීන විද්‍යාවත් පෛතගරස් ගණිත ශාස්ත්‍රයත් සොක්‍රටීස් ආචාරධර්ම විද්‍යාවත් පිළිබඳව වැඩි ප්‍රසිද්ධියකට පත්වූහ.

පෙරදිග දර්ශනවලදී මුල් යුගයේ ස්වභාව ධර්මය දේවත්වයෙන් සැලකූ ත්‍රිවේදාගත වෛදික දර්ශනයත් අනතුරුව ආත්මය, කර්මය, පුනර්භවය, විමුක්තිය ආදී ගැඹුරු කරුණු පිළිබඳව විග්‍රහ කෙරෙන් බ්‍රාහ්මණ, ආරණ්‍යක, උපනිෂද් වැනි පශ්චාත් වෛදික දර්ශනත් ඒවාට පදනම් වූ වෛදික ෂඩ් දර්ශනත් බිහිවිය. එහිදී **කණාද** ඍෂිවරයාගේ වෛශෙෂික දර්ශනයෙන් නිත්‍ය පරමාණුවාදය සහ ඊශ්වරවාදයත් ඉගැන්විණ. න්‍යාය දර්ශනයෙහි ආදිකර්තෘ **අක්ෂපාද** විසින් ආත්මවාදය හා ඊශ්වරවාදයත් ඉගැන්විණ. **කපිල** ඍෂිවරයාගේ සාඞ්ඛ්‍ය දර්ශනයෙන් **ප්‍රකෘති-පුරුෂ** පදාර්ථ දෙක මුල් කරගත් පරාපෘථවාදයක් ඉගැන්විණ. **ජෛමිනීගේ** මීමංසා දර්ශනයෙන් බහුදේවවාදයක් සහ ආත්මවාදයක් ඉගැන්විණ. **පතඤ්ජලී** මුනිගේ යෝගදර්ශනයෙන් නිත්‍ය ඊශ්වරවාදයක් සහ ආත්මවාදයක් ඉගැන්විණ. බාදරායණගේ වේදාන්ත දර්ශනයෙන් ආත්ම සහ පරමාත්ම දෙකම එකක් ලෙස සැලකූ අද්වෛතවාදයක් සහ ආත්මවාදයක් ඉගැන්විණ.

අනතුරුව 'ශරීරයට අධික දුක් දීමෙන් කර්මක්ෂය කළ හැකිය' යන අත්තකිලමථානුයෝගය පදනම් වූ **නිගණ්ඨනාථපුත්තගේ** තාපනවාදී දර්ශනයත්, **චන්ද්‍රයා** ස්වරූපයෙන් ඉබේ සිදුවන සත්ත්වයාගේ සංසාර ගමනේ කෙළවර විමුක්තිය ලැබීම හැර කර්මයන්ගේ විපාකයක් නැතැයි බැහැර කළ **මක්ඛලිගෝසාලගේ** දර්ශනයත්, පින්පව් සිදුවිය හැකි කර්ම නැතැයි කියමින් කර්මය බැහැර කළ **පූර්ණකාශ්‍යපගේ** අකිරියවාදි දර්ශනයත්, මරණින් මතු උපතක් නැතැයි කියමින් විපාකය බැහැර කළ **අජිතකේසකම්බලීගේ** උච්ඡේදවාද දර්ශනයත්, ලෝකයා හා සත්ත්වයා **පඨවි, ආපෝ, තේජෝ, වායෝ, සුඛ, දුක්ඛ, ජීව** යන සප්ත පදාර්ථයෙන් නිර්මාණය වීම හැර වෙනත් කිසිවෙකුගේ කිරීමක් හෝ මැවීමක් නොවේයැයි කියූ ශාස්වතවාදි **පකුධකච්චායනගේ** දර්ශනයත්, ක්ෂණභඞ්ගුරවාදය අවියක් ලෙස භාවිත කරමින් කර්මය, විපාකය වැනි දේ ගැන ස්ථිර අදහසක නොපිහිටා ක්‍රියා කළ **සංජයබෙල්ලට්ඨීයපුත්තගේ** අමරාවික්ෂේපවාදි දර්ශනයත් යනුවෙන් **ජෛන දර්ශන 6** ක් බිහිවිය.

ඉන්පසු කර්මය, පුනර්භවය, විමුක්තිය වැනි ගැඹුරු ප්‍රශ්නවලින් වෙහෙසට පත්ව සිටි එදා සමාජයට කර්මය, විපාකය, දේවත්වය, විමුක්තිය යන කරුණු බැහැර කොට මෙලොව කවර අයුරකින් හෝ සුඛෝපභෝගී ජීවිතයක් ගතකිරීමම නිවන යැයි පෙන්වූ **බෘහස්පතිගේ** චාර්වාක දර්ශනයක් ද ව්‍යාප්ත විය. එහිදී පුදපූජා විධි, ප්‍රතිපදාව, පඤ්චශීලය, ත්‍රිමූර්තිය වැනි කරුණු උපහාසයට ලක්කර ඇත. මද්‍ය, මත්ස්‍ය, මාංශ, මෘද්‍ර, මෛථුන යන පඤ්චමකාරය (ශීලය) හැරුණු විට වෙනත් ශීල ප්‍රතිපදාවක් හෝ උපරිම අයුරින් මත්වීමෙන් ලබන සතුට හැරුණු විට වෙනත් කිසිම නිවනක්; මොක්ෂයක්; විමුක්තියක්; නැතැයි ඉගැන්විණ.

**"පීත්වා පීත්වා පුනඃ පීත්වා - පුනඃ පතති භූතලෙ,**

**උත්ථාය ච පුනඃ පීත්වා - පුනර්ජන්ම න විද්‍යතෙ."**

යනුවෙන් ඔහු පුනර්ජන්මය සහ නිවන පිළිබඳ කෙටි හැඳින්වීමක් කර ඇත. එහිදී ත්‍රිමූර්තිය ලොව සිටින ලොකුම හොරුන් තිදෙනා ලෙස හඳුන්වා දී ඇත. දානශීලාදී ප්‍රතිපදාවන් ඒ ඒ අයගේ බඩ වඩා ගැනීමේ උපක්‍රමයක් ලෙස උපහාසයට ලක්කොට ඇත.

මෙම සියලුම දර්ශනවලින් ඉගැන්වෙන ශාස්වත-උච්ඡේද හා අමරාවික්ෂේප ආදි ප්‍රතික්ෂේප කරමින් කාමසුඛල්ලිකානුයෝගය හා අත්තකිලමථානුයෝගය බැහැර කොට ත්‍රිවිධ ශික්ෂා මාර්ගයෙන් මධ්‍යමප්‍රතිපදානුකූල මෝක්ෂගාමී ප්‍රතිපදාවත්, අනාත්මවාදි පදනමක් මත විග්‍රහ කළ බුදුදහම සියලු දර්ශනයන්ට වඩා තර්කානුකූල මෙන්ම බුද්ධිගෝචර වූවක් වූ බැවින් එය සෙසු දර්ශන අභිභවමින් ව්‍යාප්ත වන්නටත් ජනප්‍රිය වන්නටත් විය. **දීඝනිකායේ බ්‍රහ්මජාල** සූත්‍රයේදී මේ පිළිබඳ විග්‍රහයක් කරණ බුදුරදහු මේ සියලුම දර්ශන සත්‍යය පදනමක සිට බලන විට **අර්ධ සත්‍ය** සහ **අසත්‍ය** වශයෙන් කොටස් කළ හැකි බවත් ඒවා **ශාස්වත-උච්ඡේද හා අමරාවික්කේෂ්පවාද** වශයෙන් වෙන් කළ හැකි බවත් දේශනා කර ඇත. එම දෘෂ්ටීන්ගෙන් **44** ක් ශාස්වතවාද ගණයටත් **14** ක් උච්ඡේදවාද ගණයටත් 4 ක් අමරාවික්ෂේපවාද ගණයටත් කොටස් කර දක්වා ඇත.

**වෛශේෂික දර්ශනය**

ක්‍රි.පූ. 150-200 අතර විසූවෙකු ලෙස සැලකෙන **කණාද** ඍෂිවරයා විසින් නිපදවූ දර්ශනය වෛශේෂික දර්ශනයයි. මෙය වෛශේෂික නමින් හඳුන්වා ඇත්තේ <u>පදාර්ථ අතර විශේෂ නමින් පදාර්ථයක් ඇතුළත් කිරීම නිසා</u> යැයි සමහරු අරුත් දක්වති. තවත් සමහරු අනෙක් පැරණි වෛදික දර්ශනවලට වඩා ලෝකයේ මූලහේතුව දක්වූ විශිෂ්ට දර්ශනයක් නිසා වෛශේෂික වීයැයි දක්වති. ඒ අදහසම චීන දාර්ශනික විග්‍රහයකින් ද සනාථ කෙරේ. මේ දර්ශනයට තවත් නමක් නම් **'ඖලූක්‍ය දර්ශනය'** නමි. කණාද ඍෂිවරයා **'උලූක'** නමින් හැඳින්වෙන හෙයින් ඔහු නිපදවූ දර්ශනය එසේ විනැයි මතයකි. ඔහු උලූක නමින් හඳුන්වන්නට ඇත්තේ ග්‍රීක දාර්ශනික ඩිමොක්‍රිටස්ගේ පරමානුවාදය අනුව ලෝකයේ මූලකාරණය පරමාණුව යැයි පිළිගැනීමත් වෛශේෂික දර්ශනය යවන දර්ශනයෙන් ආභාසය ලැබීමත් නිසා යැයි තවත් මතයකි. පරමාණුව ගැණ පමණක් නොව **ද්‍රව්‍ය, ගුණ, කර්ම, සාමාන්‍ය, විශේෂ, සමවාය, දිශා, කාල, පරිමාණ** ආදි ග්‍රීක දර්ශනවලට සමාන වචන හා විග්‍රහයන් යෙදී තිබීමත් කලින් සඳහන් කළ ග්‍රීක ආභාසය ලැබූ බවට තවත් සාධකයකි. යවනයන්ගේ භාරත ආක්‍රමණයෙන් පසු ග්‍රීක දාර්ශනයෙන් ද ආභාසය ලබමින් ආත්මවාදය තහවුරු කිරීම සඳහා කණාද ඍෂිවරයා වෛශේෂික දර්ශනය නිපදවූ බව පොදු පිළිගැනීමක් බවට පත්ව ඇත.

බෞද්ධ අනාත්මවාදයෙන් ප්‍රතික්ෂේප වූ ආත්මවාදය රැක ගැනීමට කණාද ඍෂිවරයා යවනයන්ගේ සාමාන්‍ය හා විශේෂ පදාර්ථ යොදාගෙන ඇත. ඔහු වෛදික අනෙක් දර්ශනවල මෙන් ලෝක නිර්මාණය සඳහා ඊශ්වරයෙකු කෙලින් යොදා නොගත්තත් නිත්‍ය පරමාණුවක් පිළිගත් බැවිනැයි කිව හැකිය. මෙය භාරතීය පරමාණුවාදය නමින් හැඳින්වෙන්නේ ද එබැවිනි. ඔහු ආභාසය ලැබූ ඩිමොක්‍රිටස්ගේ පරමාණුවාදය අනුව ලොව ඇති සියල්ලම භෞතික වශයෙන් නොබෙදිය හැකි පරමාණුවලින් නිර්මිත වී ඇත. එම විග්‍රහය අනුව පරමාණු අතර හිස් අවකාශයක් ඇත. පරමාණු අවිනාශීය. ඒවා වස්තූන්ගේ අත්‍යන්ත ශුක්ෂ්ම තත්ත්වයක් වුව ද එහිද පරිමාණයක් ඇත. හැඩයෙන් මෙන් ම විශාලත්වයෙන් ද වෙනස්කම් වලින් යුතුය. තාපය හා බර අතින් බලන විට ගෝලාකාර පරමාණු අධික උෂ්ණත්වයෙන් මෙන් ම බරින් ද වැඩිය. ඒවා නිතර චලනය වෙමින් පවතී. 'එක් පරමාණුවක් තවත් පරමාණුවක් සමග එක්වීමට සූදානමින් පවතී. එම පරමාණුවලින් සත්ත්වයා මෙන්ම ලෝකය ද සෑදී ඇත' යනුවෙන් කරණ විග්‍රහයක් කණාද ඍෂිවරයාගේ **වෛශේෂික සූත්‍ර** නම් වූ ග්‍රන්ථයෙන් තහවුරු කෙරේ. තර්ක ශාස්ත්‍රයට වැඩි වශයෙන්ම ඇතුළත් වනුයේ වෛශේෂික දර්ශනයෙහි එන කරුණු බැව් මේ අනුව පැහැදිලි වේ. ඔහු දක්වන පරිදි කාලය ද නිත්‍ය වූවකි. එය එසේ වනුයේ සැමදා බාල, තරුණ, මහලු ආදි ව්‍යවහාරයට හේතුවන බැවිනි. ඔහු දක්වන පරිදි දිශා ද නිත්‍ය ද්‍රව්‍යයකි. නැගෙනහිර ආදි ව්‍යවහාරයට එය හැමදාමත් අවශ්‍ය බැවිනි. මේවා ආත්මවාදය තහවුරු කිරීමට

යොදාගත් යෙදුම් බැව් පෙනේ. බෙදීම්වලට හා ව්‍යවහාරයට හේතුවන දේ සත්‍ය වශයෙන් බලන විට නිත්‍ය විය නොහැකියි. වෙනස්වීම්වලට භාජනය වන හැමදේම අනිත්‍ය වන බැව් බුදුදහමින් ඉගැන්වේ. වෛශේෂික දර්ශනයෙහි **ආත්මය හා මනස** ද ද්‍රව්‍යාත්මක නිත්‍ය වස්තූන් ය. ආත්මය සියල්ලෙහිම පැතිර පවතී. එම ආත්මය ජීවාත්ම-පරමාත්ම යැයි දෙපරිදි වේ. ජීව ආත්මය හා ශරීරය බැඳී පවතියි. ඒ නිසා එය අනිත්‍යය. පරමාත්මය ඊශ්වරයා සතුයි. එවිට එය නිත්‍ය, සදාකාලික වේ. ලෝකයේ උපත හා විනාශය සිදු වනුයේ පරමාණුවල එක්වීම හා වෙන්වීම අනුවයි. පරමාණු ඒක්ව සෑදුණු ලෝකය ජීවාත්මයේ (සත්ත්වයාගේ) මනස තෘප්තිමත් කිරීම පිණිස පවතී. පරමාණුවල එක්වීම හා වෙන්වීම ඊශ්වරයාගේ කැමැත්ත අනුව සිදු වේ. මෙහි දැක්වූ ගුණ **24** න් **බුද්ධි-ඉච්ඡා** යන්න හා ගුණ තුණ ඊශ්වරයා සතුව ඇති විට නිත්‍ය වේ. **බුද්ධි, සුඛ, දුක්ඛ, ඉච්ඡා, ද්වේෂ, ප්‍රයත්න, ධර්ම, අධර්ම** යන ගුණ 8 ජීවාත්මය සතුව පවත්නා විට අනිත්‍ය වේ. ජීවාත්මය මේ අටෙන් වෙන් වූ විට විමුක්තිය ලැබේ. ශබ්දය පිළිබඳ අපට අවබෝධය ලැබෙනුයේ ඊශ්වරයාගේ කැමැත්ත අනුවයි. මේ කරුණු සලකා බලන විට නිත්‍යවාදය, ඊශ්වරවාදය හා සියල්ල කර්ම නියාමය අනුව සිදුවේයැයි කියන කීම අනුව ද මේ දර්ශන බෞද්ධ දර්ශනය සමග එකිනෙකට විරුද්ධ වේ.

**න්‍යාය දර්ශනය**

ක්‍රි.ව.250 දී විසූ ලෙස සැලකෙන අක්ෂපාද හෙවත් **ගෞතම ඍෂිවරයා** විසින් ගොඩ නැගූ න්‍යාය දර්ශනය මූලිකවම ආත්මය පිළිගනී. න්‍යාය දර්ශනය කුමක්දැයි හැඳින්වූ ඔහු **"ප්‍රමාණෛරර්ථපරීක්ෂණං න්‍යායඃ"** යනුවෙන් ලෝකයේ දතයුතු සියල්ලම **"ප්‍රත්‍යක්ෂ, අනුමාන, උපමාන, ශබ්ද"** යන චතුර්විධ ප්‍රමාණයෙන් පරීක්ෂණය කරණ හෙයින් න්‍යාය යැයි හඳුන්වන බව දක්වයි. තවදුරටත් ඒ පිළිබඳ විග්‍රහයක යෙදෙන ඔහු ප්‍රත්‍යක්ෂයෙන් දක්නා ලද දේ අනුව ප්‍රත්‍යක්ෂ නොවූ දෙය ද අනුමානයෙන් අවබෝධ කරණ බැවින් න්‍යාය දර්ශනය **"ආන්වීක්ෂිවිද්‍යා"** නමින් හැඳින්විය හැකියැයි කියයි. මේ අනුව න්‍යාය දර්ශනයේදී ප්‍රධානත්වය ලැබෙන්නේ ප්‍රත්‍යක්ෂයට නොව අනුමානයටයි. එනම් අනුමාන ප්‍රමාණයෙහි එන

1. ප්‍රතිඥා  2. හේතු  3. උදාහරණ  4. උපනය  5. නිගමන

යන පඤ්චාවයව වාක්‍යයම යථාර්ථ සාධනයෙහි ප්‍රමාණවන බවයි. **බෞද්ධ දාර්ශනිකයෝ** මේ සඳහා **හේතු-සාධ්‍ය** දෙක පමණක් අනුමානයට ප්‍රමාණවත් වන බවත් න්‍යාය දර්ශනයේ දක්වන අවයව පහ ඉහත සඳහන් කළ හේතු-සාධ්‍ය දෙකටම ඇතුළත් කළ හැකි බවත් දක්වති. න්‍යාය දර්ශනය වෛශේෂික දර්ශනය සමග බොහෝ තන්හිදී සමානය. මෙම දර්ශනය තර්කය මතම ගොඩ නැගුනක් බැවින් තාර්කික දර්ශනයක් ලෙස ද පිළිගැනේ. මැවුම්කරුවෙකු පිළිගැනීමත් ආත්මයක් ඇතැයි පිළිගැනීමත් නිසා මූලික වශයෙන් මෙම දර්ශනය බෞද්ධ දර්ශනයට පටහැනි වෙයි. බෞද්ධ දාර්ශනික නාගර්ජුනපාදයන් විසින් රචිත 'විග්‍රහව්‍යාවර්තිනී' ග්‍රන්ථයේදී දැක්වූ පරමාර්ථ වශයෙන් බලන විට ප්‍රමාණ වශයෙන් ගතහැකි දෙයක් නැතැයි කී කීමට පිළිතුරු වශයෙන් අක්ෂපාද ඍෂිවරයා 'න්‍යාය සූත්‍ර' නමින් ග්‍රන්ථයක් රචනා කළේය. ඒ අනුව කරුණු දක්වන ඔහු

**1. ප්‍රත්‍යක්ෂ 2. අනුමාන 3. උපමාන 4. ශබ්ද** යන ප්‍රමාණ ඔස්සේ ෂෝඩස පදාර්ථාවබෝධයෙන් දුක, දෝෂය, මිථ්‍යාඥානය යන ඒවා නැසූ පසු අපවර්ගය හෙවත් මෝක්ෂය ලැබිය හැකි බව අවධාරණය කරයි. රාග, ද්වේෂ, මෝහ පිළිබඳ මිථ්‍යාඥානය නිසා ආත්මය ජාති, ජරා, මරණ ආදියට පත්වෙයි. එම ආත්මය **ජීවාත්ම-පරමාත්ම** යැයි දෙකකි. ජීවාත්මය ශරීරයක් පාසා පවත්නා අනිත්‍ය වූවකි. පරමාත්මය පමණක් නිත්‍ය ද සදාකාලික ද වේ. ජීවාත්මය ලැබූ, සසර ඇවිදින සත්ත්වයා මිථ්‍යාඥානය නිසා තිදොරින් දුසිරිත් වඩා කර්මානුකූලව පුනර්භවය ද දුක් ද ලබයි. මෙය අවබෝධ කොට ගෙන මෝහය ප්‍රහීන කොට ඒ නිසාම රාගාදිය ද නසා තත්ත්වාවබෝධයෙන් පුනර්භවය නැති කළ විට මෝක්ෂය ලැබිය හැකියැයි ඔහු දක්වයි. මෙහිදී සමහර අදහස් බෞද්ධ දර්ශනයට පටහැනි නොවන බැව් පෙනේ. එසේ ලබන මෝක්ෂය සදාකාලික සුවයකි. එම මෝක්ෂය නම් පරමාත්මයයි. එය දුකින් මිදීම් මාත්‍රයක් මිස දුකක් හෝ සැපතක් නොවේ. එය අවේදිත සුඛයකැයි ඔහු දක්වයි. මෙහිදී මෝක්ෂය පරමාත්මයට සමාන කිරීම හැරුණු විට සෙසු විග්‍රහයන් බෞද්ධ මතයට පටහැනි නොවන බැව් කිව හැකිය. මේ දර්ශනයේ ප්‍රධාන පරමාර්ථය නම් එකල වැඩි දියුණු වෙමින් පැවති ආත්මවාදය බිඳ හෙළීමයි. ශබ්දය

ප්‍රමාණක් ලෙස ගැනීමත් නිත්‍ය ආත්මයක් ඇතැයි කීමත් ඊශ්වරයෙකු ඇතැයි කීමත් මූලික වශයෙන් බෞද්ධ දර්ශනයට පටහැනි වේ.

ආත්මයක් ඇතැයි පෙන්වා **ආශාව, කෝපය, උත්සාහය, සැප, දුක, ඥානය,** යන මේවා ආත්මයෙහි ලක්‍ෂණ බැව් පෙන්වයි. **ඉච්ඡා, ද්වේෂ, ප්‍රයත්න, සුඛ, දුක්ඛ, ඥාන,** ඇසින් දුටුදේ අතින් අතගා මේ එයම යැයි කීමත් විවිධ ඉඳුරන් මගින් දැනගත් දේ එක් කිරීමත් (සිතින් සිතූ දේ ඇසින් ද එලෙසම දැකීම වැනි කරුණු) ආත්මය නිසා සිදුවන්නකැයි කීමත් වම් ඇසින් දුටු දේ දකුණු ඇසින් ද හඳුනා ගැනීමත් ආත්මය නිසා සිදුවන්නකැයි කීමත් මිහිරි ආහාර දුටුවිට දිවට කෙළ උනනුයේ ආත්මය නිසා යැයි කීමත් ඔහු ආත්මයක් ඇතැයි යන්නට යොදාගත් නිදසුන් බව න්‍යාය සූත්‍ර ග්‍රන්ථය අනුව පැහැදිලි වේ.

## යෝගාචාර දර්ශනය

යෝගාචාර දර්ශනයේ වර්ධනය සිදු වූයේ අයොධ්‍යාව පසුබිම් කොටගෙනයි. අසඞ්ගයන්ගේ බලවත් උත්සාහය නිසා අයොධ්‍යාව හැරුණු විට ගන්ධාරයෙහි ද මෙය ප්‍රචලිත විය. මෙම දර්ශනය නාලන්දා විශ්වවිද්‍යාලයෙහි ද ප්‍රධාන විෂයක් වශයෙන් ඉගැන්වූ බැව් හ්‍යුං සියැන්ගේ වාර්තාවල දැක්වේ. මේ අනුව **ක්‍රි.ව.1** සියවසේ සිට **ක්‍රි.ව.7** සියවස දක්වා යෝගාචාර දර්ශනය භාරතයෙහි ජනප්‍රියත්වයට පත්විය. එහි ප්‍රතිඵලයක් වශයෙන් එය මධ්‍ය ආසියාව හරහා චීනයටත් අනතුරුව ටිබෙටයටත් පැතිර ගියේය. එම යුගය වන විට **මන්ත්‍ර නිකාය, තන්ත්‍ර නිකාය හා ධ්‍යාන නිකාය** වශයෙන් කොටස් තුණක් බවට පත් වී තිබිණ. තන්ත්‍ර නිකායම තන්ත්‍රයානය වශයෙන් හැඳින්වූ බවත් ජපන්, චීන, ටිබෙට් රටවල දැනට පවත්නා සෙන් බුදුදහම නමින් හැඳින්වනුයේ ද කලින් සඳහන් කළ කොටස් තුනෙන් ධ්‍යාන නිකායම බවත් විචාරක මතයයි. ටිබෙටයේදී යෝග කිරීම හෙවත් භාවනා කිරීම යනුවෙන් එය නව මුහුණුවරකින් සකස්ව ඇත.

යෝගාචාර දර්ශනයේ හෙවත් විඥානවාදයෙහි මූලිකයා ලෙස ගැනෙනුයේ '**මෛත්‍රෙයනාථ**' හිමියන් ය. එතුමන් **විඥානවාදය** තහවුරු කිරීමට ලියා ඇති ග්‍රන්ථ රාශියකි. ඒ අතුරෙන් '**අභිසමයාලංකාර සූත්‍ර, සූත්‍රාලංකාර, මහායාන උත්තරතන්ත්‍ර**' යන ග්‍රන්ථ බෙහෙවින් ප්‍රචාරයට පත් විය. එසේ වුවද යෝගාචාර දර්ශනය ජනප්‍රියත්වයට පත් කරන ලද්දේ **අසඞ්ග හා වසුබන්ධු** යන හිමිවරුන් විසිනි. මෙයිනුත් අසඞ්ග හිමියන් ප්‍රමුඛත්වයෙහිලා සැලකේ. උන්වහන්සේගේ ජීවන සමය **ක්‍රි.ව.360** සිට ඇරඹෙයි. කලින් කෞෂික ගෝත්‍රයට අයත් බ්‍රාහ්මණයෙකු වූ මෙතුමා විඥානවාදයේ ව්‍යාප්තිය සඳහා

❶ යෝගාචාරභූමිශාස්ත්‍ර

❷ අභිධර්මසමුච්චය

❸ ප්‍රඥාපාරමිතා විනිශ්චය

වැනි කෘති රාශියක් රචනා කොට ඇත. යෝගාචාරීන්ගේ මූල ග්‍රන්ථයක් ලෙස ලංකාවතාර සූත්‍රය සැලකිය යුතුයැයි සුස්ටන් නම් විචාරකයාගේ අදහසයි. ආචාර්ය සුසුකි පඬිවරයා ද 'Studies in the Lankavathara sutra' නම් ග්‍රන්ථයේදී කලින් සඳහන් කළ මතයම තහවුරු කරයි. යෝගාචාර දර්ශනයෙහි ප්‍රායෝගික අංශය යෝගාචාරයෙහි යෙදීම වන අතර එහි දාර්ශනික අංශයෙන් විඥානවාදය විස්තර කෙරේ. ඔවුන්ගේ ඉගැන්වීම් අනුව බාහිර ලෝකය යැයි අමුතු දෙයක් නොමැත. එය සිතෙහි නිර්මාණයක් පමණි. සත්‍යය නම් ඒවා විඥානයෙහි මැවීම් බවයි. නැත්නම් ඒවා විඥානයෙහි විකෘති තත්වයක් බවයි යනුවෙන් ලංකාවතාර සූත්‍රයෙහි දැක්වේ. මෙම දර්ශනයේ සම්භාවිත ආචාර්යවරුන් අතර **මෛත්‍රෙයනාථ, අසඞ්ග, වසුබන්ධු, දින්නාග, ස්ථිරමති, ධර්මපාල, ධර්මකීර්ති** යන හිමිවරුන් ප්‍රධානත්වයෙහිලා සලකති. එයින් ධර්මකීර්ති හිමියන් විසින් ග්‍රන්ථ රැසක් සම්පාදනය කර ඇත. එයින්

න්‍යාය බින්දු

හේතු බින්දු

**ප්‍රමාණවාර්තික** යන පොත් ප්‍රමුඛත්වයෙහිලා සැලකේ.

විඥානවාදීන්ගේ දර්ශනය අනුව ෂඩින්ද්‍රියයන් ඇසුරින් ලබන විඥාන සයෙන් මනෝ විඥානයත් ආලයවිඥානයත් යන අෂ්ට විඥානයම ප්‍රධාන කොටස් තුණකට බෙදේ. එනම්

❶ ප්‍රවෘත්ති විඥානය ❸ මනෝවිඥානය ❸ විපාක විඥානය (හෙවත් ආලය විඥානය)

මෙයින් ප්‍රවෘත්ති විඥානය යනු ඉන්ද්‍රිය ඥානයයි. **චක්‍ෂු, ශ්‍රෝතස්, ඝ්‍රාන, ජිහ්වා, කාය, මන** යනුවෙන් සවැදෑරුම්ව උපදනා රූප ශබ්දාදිය නිසා පහල වන සිතුවිලි පරම්පරාවයි. මනෝවිඥානය යනු 'න්‍යාය බින්දු' ආදියෙහි විස්තර කළ මනෝවිඥානයයි. එය ආලය විඥානය ඇසුරු කොට පවතී. එසේම එය ප්‍රවෘත්ති විඥානයටත් ආලය විඥානයටත් අතරතුර පවතින්නකි. මමත්වය, ආත්මවාදය, පුද්ගලවාදය වැනි කරුණු රඳා පැවතීම මෙයින් තහවුරු කිරීම ද කෙරෙනුයේ මනෝවිඥානයෙනි. **ස්පර්ශ, වේදනා, සංඥා, චේතනා, මනස්කාර** යන චෛතසික 5 ත් **ආත්ම දෘෂ්ටි, ආත්ම මෝහ, ආත්ම මාන, ආත්ම ස්නේහ** යන චෛතසික 4 ත් යනුවෙන් චෛතසික 9 ක් එහි යෙදේ. මෙය කිලිටි සිත හෙවත් ක්ලිෂ්ට මනෝවිඥානය යනුවෙන් ද හැඳින්වේ. රහතුන්ටත් අනාගාමීන්ටත් එම ක්ලිෂ්ට මනෝවිඥානය නැති බැව් කියති. අපරදිග මනෝවිද්‍යාඥයින් විසින් මෙය 'Subconscious Mind' වශයෙන් හඳුන්වනු ලැබේ. මෙසේ දැක්වූ මෙම විඥානයන් එකිනෙකට සම්බන්ධ වනුයේ හේතුඵල න්‍යාය අනුවයි. ඒ අනුව මෙම ත්‍රිවිධ විඥානයේ පරිණාමය හේතු සහ ඵල වශයෙන් කොටස් දෙකකි. එයිනුත් හේතුපරිණාමය නම් කුසල හෝ අකුසල හෝ අව්‍යාකෘත හෝ ෂඩින්ද්‍රිය ඥානයත් සහ මනන විඥානයත් යන සප්ත විඥානය නිසා පහළ වන වාසනා ශක්තියයි. එය **නිෂ්‍යන්ද හේතු** හා **විපාක හේතු** වශයෙන් ද සැලකේ. ඵල පරිණාමය නම් කලින් දැක්වූ සප්ත විඥානයන් නිසා පහළ වන හේතු හා විපාක ශක්තීන් නිසා ආලය විඥානය ඇතිකර වීමයි. ඒ අනුව මුල් සප්ත විඥානය හේතු පරිණාමයටත් අටවැනි ආලයවිඥානය ඵල පරිණාමයටත් ගැනේ.

# තර්ක සංග්‍රහය

වෛදික ෂඩ් දර්ශනවලින් වෛශේෂික හා න්‍යාය දර්ශන දෙක පදනම් කොට තර්ක සංග්‍රහය බිහිවිය. එවිට තර්ක ශාස්ත්‍රය ද දර්ශනයේම අංගයක් වෙයි. දර්ශනයෙන් බැසගන්නා නිගමන සඳහා තර්කය යොදා ගැනේ. ඉන්ද්‍රිය විෂය වූ දෙයක් ඇසුරින් අවිෂය වූ දෙයක් ගැන **ප්‍රත්‍යක්ෂ, අනුමාන, උපමාන, ශබ්ද** යන ප්‍රමාණ ඔස්සේ **ප්‍රතිඥා, හේතු, උදාහරණ, උපනය, නිගමන** යන අංග පහකින් යුත් තර්ක පිළිවෙළකින් නිගමනයකට බැසගනු ලැබීම තර්ක ශාස්ත්‍රීය නිගමනය ලෙස සැලකේ. බෞද්ධ දර්ශනය තර්කය මත පදනම් වූවක් නොවේ. 'අතක්කාවචරො' යනුවෙන් සත්‍යාවබෝධයේදී තර්කයෙන්ම පමණක් අවබෝධ කළ නොහැකි බැව් එයින් කියැවේ. භාරතීය දර්ශන අතර බෞද්ධ දර්ශනයෙන් අනාත්මවාදයත් සෙසු දර්ශනවලින් ආත්මවාදයත් ස්මතු වේ. <u>තර්ක සංග්‍රහයෙන් ද සිදු කොට ඇත්තේ ආත්මයක් ඇතැයි යන්න ඔප්පු කිරීමයි.</u> භාරතීය පරමාණුවාදය නමින්ද හැඳින්වෙන වෛශේෂික දර්ශනයෙන් පඨවි, ආපෝ ආදී මූර්ත ද්‍රව්‍ය ගැනත් ආකාශ, ආත්ම ආදි අමූර්ත ද්‍රව්‍ය ගැනත් ආලෝක තරඞ්ග, ශබ්ද තරඞ්ග, විදුලිය වැනි ස්වභාවික කරුණු ගැනත් මෙහි විස්තර කෙරෙතත් එම දර්ශනයේ නිර්මාතෘ ගෞතම හෙවත් කණාද ඍෂිවරයාට අවශ්‍ය වූයේ බෞද්ධ දර්ශනයෙන් යටපත්වෙමින් පැවති ආත්මවාදය නැවත ඔසවා තැබීමයි. සසර දුකින් මිදීමට ආත්මවාදය අවශ්‍ය වන හැටි පෙන්වා දීමටයි. න්‍යාය දර්ශන කර්තෘ අක්ෂපාද හට අවශ්‍ය වූයේ ද එයමයි. ආත්මවාදි වෛදිකයන්ගේ අනාත්මවාදි බෞද්ධයන්ගේත් මේ මත දෙකෙහි ගැටීම් නිසා භාරතීය දර්ශන ශාස්ත්‍රයන් තර්ක විද්‍යාවන් දියුණුවට පත් වේ. **කණාද, අක්ෂපාද, චාණක්‍ය** වැන්නන්ගේ ආත්මවාදි තර්කවලට බෞද්ධ පක්ෂයෙන් **නාගර්ජුන, දින්නාග, ධර්මකීර්ති** වැනි උගත්තු අනාත්මවාදි පදනමක සිට ආත්මවාදය නිෂ්ප්‍රභා කළහ. තර්ක සංග්‍රහ කර්තෘ අන්නම්භට්ටාචාර්යයන් විසින් ද බෞද්ධ න්‍යායට පහරදීමට තර්ක සංග්‍රහය යොදාගන්නා ලදී. තර්ක සංග්‍රහයේ එන යතාර්ථාවබෝධයට ඉවහල් වෙතැයි දක්වූ ප්‍රමාණ නමින් වෙන් කළ **ප්‍රත්‍යක්ෂ, අනුමාන, උපමාන, ශබ්ද** යන ප්‍රමාණ සතර න්‍යාය දර්ශනයෙන් ද **ද්‍රව්‍ය, ගුණ, කර්ම, සාමාන්‍ය, විශේෂ, සමවයා, අභාව** යන සප්ත පදාර්ථ හෙවත් මූල ධර්මයන් වූ ප්‍රමේය හත වෛශේෂික දර්ශනයෙන් ද ගෙන ඇත. මේ කරුණෙහිදී ඒ ඒ දාර්ශනිකයන්ගේ හැඟීම් පරිදි සත්‍යාවබෝධයට ඉවහල්වන ප්‍රමාණ එක් එක් අයුරින් දක්වා ඇත. ඒ අනුව චාර්වාක දර්ශනයේ **ප්‍රමාණ** 1 කි. එනම් **ප්‍රත්‍යක්ෂය** පමණි. බෞද්ධ දර්ශනයේ **ප්‍රමාණ** 2 කි. එනම් **ප්‍රත්‍යක්ෂ, අනුමාන** යනුයි. ජෛනයන්ගේ දර්ශනයෙහි **ප්‍රමාණ** 4 කි. එනම් **ප්‍රත්‍යක්ෂ, අනුමාන, උපමාන, ආගම** යනුවෙනි. න්‍යාය-වෛශේෂික දර්ශනවල **ප්‍රමාණ** 4 කි. එනම් **ප්‍රත්‍යක්ෂ, අනුමාන, උපමාන, ශබ්ද** යනුවෙනි. වෙනත් දර්ශනවල තවත් ප්‍රමාණ සංඛ්‍යාව වැඩිපුර දක්වනු ලැබේ. න්‍යාය බින්දු කර්තෘගේ විග්‍රහය අනුව අන්‍ය දාර්ශනිකයන් දක්වූ **උපමාන, ශබ්ද, අර්ථාපත්ති, අනුපලබ්ධිය** වැනි විවිධ ප්‍රමාණ වලින් අනුමානයටම ඇතුළත් කළ හැකි සමහර කරුණු හැරුණු විට අනෙක්වා ප්‍රමාණ වශයෙන් ගැනීමට තරම් ප්‍රබල ඒවා නොවන බැව් දක්වේ. මේ අනුව ඕනෑම නිගමනයකට බැස ගැනීමට ප්‍රත්‍යක්ෂය හා අනුමානය යන ප්‍රමාණ දෙක පමණක් ප්‍රමාණවත් බැව් බෞද්ධයන්ගේ මතයයි. තර්ක සංග්‍රහයෙහි, ලෝකය සප්ත පදාර්ථයකට හෙවත් මූලධර්ම 7 කට බෙදේ. එනම්,

1. ද්‍රව්‍ය 2. ගුණ 3. කර්ම 4. සාමාන්‍ය 5. විශේෂ 6. සමවාය 7. අභාව වශයෙනි. **(ද්‍රව්‍ය-ගුණ-කර්ම-සාමාන්‍ය-විශෙෂ සමවායා'භාවාඃ සප්ත පදාතර්ථාඃ)** මේ හතෙන් **මුල් 6 භාව පදාර්ථ** ලෙසත් **සත්වැන්න අභාව පදාර්ථය** ලෙසත් ගැනේ. එයිනුත් භාව පදාර්ථ 6 යෙන් මුල් 3 සත්‍ය ප්‍රමාණභාවයි. අනෙක් තුන කාල්පනිකභාවයි. සත්වැන්න අභාවය සම්පූර්ණ අවිද්‍යමානත්වයයි. තර්ක සංග්‍රහ කර්තෘ මේ පදාර්ථ 7 උද්දේස හෙවත් නමින් හැඳින්වීම, ලක්ෂණ වෙන්කොට ස්වරූපය දක්වීම, පරීක්ෂා පදාර්ථ සමග සැසඳීම යනුවෙන් ක්‍රම තුණක් ඇසුරෙන් විග්‍රහ කොට ඇත.

1. ද්‍රව්‍ය යනු **නිත්‍ය, අනිත්‍ය, මූර්ත, අමූර්ත, චර, අචර, භාව, අභාව** වශයෙන් බෙදිය හැකි දෙයයි. එය කොටස් 9 කට බෙදේ. එනම්, **1. පෘථුවි 2. ආප් 3. තේජස් 4. වායු 5. ආකාශ 6. කාල 7. දිග් 8. ආත්ම 9. මනස්** යනුවෙනි. **(තත්‍ර ද්‍රව්‍යානි පෘථිව්‍යාප්, තෙජො, වායාවා'කාශ, කාල, දිගාත්ම, මනාංසි නවෙව.)** **'පෘථුවි'** යනු ගඳ සහිත බවයි. **'ආප්'** යනු සිසිල් ස්පර්ශයයි. **'තේජස්'** යනු උෂ්ණ ස්පර්ශයයි. **'වායු'** යනු රූප රහිත ස්පර්ශයයි. **'ආකාශ'** යනු ශබ්ද නමැති ගුණයෙන් යුක්ත වූ ද්‍රව්‍යයයි. **'කාල'** යනු අතීත ආදී ව්‍යවහාරයට හේතු වූ දෙයයි. **'ආත්ම'** යනු ඥානයට ආශ්‍රය වූ ද්‍රව්‍යයයි. **'මනස්'** යනු සැපදුක් ආදිය දැනගන්නා ඉන්ද්‍රියයයි.

**ගුණ-24**

ගුණ යනු ස්වරූපයයි. එබඳු ගුණ 24 කි. රූප, රස, ගන්ධ, ස්පර්ශ, සංඛ්‍යා, පරිමාණ, පෘථක්ත්ව, සංයෝග, විභාග, පරත්ව, අපරත්ව, ගුරුත්ව, ද්‍රව්‍යත්ව, ස්නේහ, ශබ්ද, බුද්ධි, සුඛ, දුක්ඛ, ඉච්ඡා, ද්වේශ, ප්‍රයත්න, ධර්ම, අධර්ම, සංස්කාර යනුවෙනි. **(රූප, ශබ්ද, ගන්ධ, ස්පර්ශ, සඩ්ඛ්‍යා, පරිමාණ, පෘථක්ත්ව, සංයොග, විභාග, පරත්වා'පරත්ව, ගුරුත්ව, ද්‍රව්‍යත්ව, ස්නෙහ, ශබ්ද, බුද්ධි, සුඛ, දුඃඛෙච්ඡා, ද්වෙශ, ප්‍රයත්න, ධර්මා'ධර්ම සංස්කාරාශ්චතුර්විංශතිර්ගුණාඃ)**

1. රූප - ඇසට පමණක් ගොදුරුවන ගුණයයි.
2. රස - දිවට ගොදුරුවන ගුණයයි.
3. ගන්ධ - නාසයට ගොදුරුවන ගුණයයි.
4. ස්පර්ශ - කයට ගොදුරුවන ගුණයයි.
5. සංඛ්‍යා - එක දෙක ආදි ව්‍යවහාරයට හේතු වූ ගුණයයි.
6. පරිමාණ - මැනීම් ව්‍යවහාරයට හේතු වූ ගුණයයි.
7. පෘථක්ත්ව - වස්තූන් එකිනෙකට ඇති වෙනස් බවයි.
8. සංයෝග - එක්වීමයි.
9. විභාග - වෙන්වීමයි.
10. පරත්ව - ළඟ බවයි.
11. අපරත්ව - දුර බවයි.
12. ගුරුත්ව - බර බවයි.
13. ද්‍රව්‍යත්ව - ගැලීමයි.
14. ස්නේහ - පිඬු කිරීමයි.
15. ශබ්ද - කණට ගොදුරුවන ගුණයයි.
16. බුද්ධි - සියලු ව්‍යවහාරයන්ට හේතුවන ගුණය හෙවත් ඥානයයි.
17. සුඛ - සැමට රිසිව හැඟෙන ගුණයයි.
18. දුක්ඛ - සැමට නොරිසිව හැඟෙන ගුණයයි.
19. ඉච්ඡා - කැමැත්තයි.
20. ද්වේෂ - තරහවයි.
21. ප්‍රයත්න - උත්සාහයයි.
22. ධර්ම - නියමය සිදු කිරීමෙන් වන දෙයයි.
23. අධර්ම - එපා කළ දේ කිරීමෙන් වන දෙයයි.
24. සංස්කාර - එක්රැස් වීමයි.

# ආත්මය පිළිබඳ ඒ ඒ දාර්ශනික පිළිගැනීම්

## 01. වෛශේෂික මතය

ඥානයට ආශ්‍රය වූයේ **(ඥානාධිකරණමාත්මා)** ආත්මයයි. එය පරමාත්ම-ජීවාත්ම යැයි කොටස් දෙකකි. එයින් පරමාත්මය එකක්මය. ජීවාත්මය අනන්තය. පරමාත්මය දෙවියන් සතුය. ජීවීන් සියල්ලට අධිපති වෙයි. එය සර්වඥ ද වෙයි. එම පරමාත්මයාගේ කැමැත්ත පරිදි අනන්ත සත්ත්වයනට ජීවාත්මය ලබා දෙයි. ලොව පුරා පැතිර සිටින බැවින් එයින් අනන්ත ද අපරිමිත ද වේ. පරමාත්මය නිත්‍ය ද ජීවාත්මය අනිත්‍ය ද වේ. පරමාත්මය අප්‍රත්‍යක්ෂයෙන් දතයුතු වෙයි. ජීවාත්මය ප්‍රත්‍යක්ෂයයෙන් දතයුතුයි.

## 02. න්‍යාය මතය

ආත්මය මනසට ප්‍රත්‍යක්ෂ වූ ද්‍රව්‍යයකි. පරමාත්මය දේවත්වයට අයත් වූවක් බැවින් එය ආත්ම සංඛ්‍යාවෙන් ගත නොහැක. ආත්ම සංඛ්‍යාවෙන් ගතයුත්තේ ජීවාත්මය පමණි. මොවුන්ගේ මතය බොහෝ තන්හිදී වෛශේෂික මතයටම අනුකූල වෙයි.

## 03. ජෛන මතය

මහාවීර හෙවත් නිගණ්ඨනාථපුත්තාදීන් ප්‍රමුඛ කොට ඇති කර්මවාදය පිළිගත් අයගේ මතයයි. ඔවුහු ආත්මය ජීව නමින් හැඳින්වූහ. ඒ අනුව කළ කර්ම අනුව සංසාරගත වී සිට ඉන්පසු සම්‍යග්ඥානය ලබා කර්මක්ෂය කරන්නේ ද එම ජීවයයි. මේ අනුව මොහු ද ආත්මවාදී සංඛ්‍යාවට ගැනෙති. වෘක්ෂලතා ආදියට ද ජීවයක් තිබේ. ඒවා වැනසීමෙන් ප්‍රාණඝාතය සිදු වේ. කර්මක්ෂය කිරීමට ලැබූ ආත්මභාවලදී සැප විඳීමෙන් කළ නොහැකිය. ශරීරයට දුක් දීමෙන් කර්මක්ෂය කිරීම ඉක්මන් කළ හැකිය. (බෝසතුන්ගේ දුෂ්කර ක්‍රියාව ද මේ පිළිගැනීම නිසා සිදුකළ එකකැයි විචාරක මතයකි.)

## 04. වේදාන්ත මතය

ආත්ම-පරමාත්ම යන දෙකම එකකි. එය නිත්‍ය ද සදාකාලික ද වේ. බ්‍රහ්ම පදාර්ථයට ඇතුළත් වේ.

## 05. වේද මතය

ප්‍රාණයම ආත්මයයි. එය විවිධ ස්වරූපවලින් පෙනී සිටියි. එම ප්‍රාණය වූ ආත්මයට සුඛ, දුක්ඛ, ඉච්ඡා, ද්වේෂ, ප්‍රයත්න, ධර්ම, අධර්ම, සංයෝග, විභාග, බුද්ධි වැනි අවස්ථාවලට සම්බන්ධ වී විවිධ ස්වරූප ගනී.

## 06. භෞතිකවාදි මතය


චේතනාවෙන් වෙහෙසන ලද දේහයම හෙවත් සිත ඇති සිරුරම ආත්මයයි. එයින් තොරවූ වෙනත් ආත්මයක් හෝ ජීවයක් හෝ නොමැත.

## 07. බෞද්ධ මතය

'ආත්මයක් ඇත' යන්න කෙලින්ම ප්‍රතික්ෂේප කරයි. ඒ අනුව ආත්මවාදීන්ගේ නිත්‍යත්වය බිඳ වැටේ. ත්‍රිලක්ෂණ සිද්ධාන්තය අනුව කිසිවක් නිත්‍ය නොවේ. 'අත්ත' ශබ්දය භාවිත කොට ඇතත් එය සම්මුතියට මිස පරමාර්ථයට නොවේ. දීඝනිකායේ මහානිදාන සූත්‍රයේදී ආත්මවාදීන්ගේ මතයත් බෞද්ධ මතයත් වෙන් වශයෙන් පැහැදිලිව ප්‍රකාශ වේ. ඒ අනුව ආත්මවාදි මතය 'ආත්මය නිත්‍යය. විඳීම් සහිත හෙයිනි. යමක් විඳීම් සහිත ද එය නිත්‍යය. එහෙයින් ආත්මය ද නිත්‍යය.' 'යමක් පෙරළෙන සුලු නම් එය අනිත්‍යය. වින්දනය හෙවත් වේදනාව පෙරළෙන සුලුය. එබැවින් වේදනාව අනිත්‍ය වේ.' න්‍යාය බින්දුවේදී මෙය එකාදස අනුපලබ්ධීන් අතුරෙන් පළමුවැනි ස්වභාවානුපලබ්ධිය මඟින් මෙම ආත්මවාදය ප්‍රතික්ෂේප කර ඇත.

## **"සර්ව ව්‍යවහාර හේතුර්බුද්ධිර් ඥානම්"**

## **(සා ද්විධා ස්මෘතිරනුභවශ්ච, සංස්කාරමාත්‍ර ජන්‍යං ඥානං ස්මෘතිඃ, තදභින්නං ඥානමනුභවඃ තද්විධො, යථාර්ථොයථාර්ථශ්ච)**




**බුද්ධි –** සියලු ව්‍යවහාරයන්ට හෙවත් ශබ්ද ප්‍රයෝගයන්ට (අදහස් හුවමාරුවලට) හේතුවූ ගුණය බුද්ධියයි. එයම ඥානයයි. එය ස්මෘති-අනුභව යනුවෙන් දෙපරිදි වේ.

**ස්මෘති ඥානය – "සංස්කාරමාත්‍රජන්‍යං ඥානං ස්මෘති"** යනුවෙන් අතීත හේතුව දැකීමත් වර්තමාන ඵලය වූ සිහිකිරීමත් අතර වූ 'භාවනා සංස්කාර' නමින් ද හැඳින්වෙන ඥානයයි. සංස්කාර ඥානය ගලා ගොස් 'ස්මෘති ඥානය' උපදවයි. 'සංස්කාර ඥානය' යනු හේතුව හා ඵලය එකට සම්බන්ධ කරණ සන්තති ක්‍රමයයි. කෙටියෙන් කියතොත් පූර්ව ඉන්ද්‍රිය ගෝචර වූවක් සිහිකිරීමෙන් උපදනා ඥානය ස්මෘති ඥානය යැයි කිව හැකිය. එයින් වෙන්වූයේ හෙවත් වර්තමානයේ ඉන්ද්‍රිය ප්‍රත්‍යක්ෂය වූයේ අනුභව ඥානයයි. එම අනුභවය යථාර්ථ-අයථාර්ථ යැයි කොටස් දෙකකි.

**යථාර්ථානුභවය–** යථාර්ථානුභවය යනු යම් වස්තුවක් ඒ වස්තුවෙහි සත්‍ය තත්ත්වයෙන්ම දැකීමයි. **රිදී කැබැල්ලක් රිදී වශයෙන්ම දැනුම ලබන්නාක් මෙනි. (රජතමිදං රජතමිති ඥානම්.)** ( මෙම ඥානයට ප්‍රමා යැයි ද කියනු ලැබේ.**(ස එව ප්‍රමෙත්‍යුච්චතෙ)**) ප්‍රමා යනු ඵල ඥානයයි. යථාර්ථානුභවයම යථාර්ථඥානය යැයි ද කියැවේ. යථාර්ථානුභවය ධර්ම-ධර්මී යන කොටස් දෙකකින් යුක්තයි. **'රිදීවල රිදී බව'** ධර්මයි. **'රිදී බවෙන් යුතු වූ රිදී'** ධර්මී ය. මෙය විශේෂණ විශේෂ්‍ය වශයෙන් ද කිව හැකි ය.

**අයථාත්ථානුභවය-** යම් වස්තුවක් ඊට වෙනස් අයුරින් අවබෝධ වීමයි. නැතහොත් භ්‍රමය යි. **මුතුබෙලි කටුවක දිලිසෙන ස්වභාවය හෙවත් ගතිය දැක එය රිදී යැයි දකින්නාක් මෙනි. (ශුක්තා'විදං රජතමිති ඥානං - සුදුපාට රිදීමෙන් කල්පනා කිරීම)**

යථාත්ථානුභවය ප්‍රත්‍යක්ෂ, අනුමිති, උපමිති, ශාබ්ද**(යථාර්ථානුභවශ්චතුර්විධඃ. ප්‍රත්‍යක්ෂ'නුමිත්‍යුපමිති ශාබ්ද භෙදාත්)** වශයෙන් සිව්වැදෑරුම් වේ. ප්‍රත්‍යක්ෂ යනු ඉන්‍ද්‍රියයත් අරමුණත් අතර ඇතිවන සංනිකර්ෂය (ගැටීම) නිසා හටගන්නා ඵලඥානයයි. එහි හේතුව ද ප්‍රත්‍යක්ෂ යන වචනයෙන්ම හැඳින්වේ. **"ප්‍රත්‍යක්ෂයං කල්පනාපොඩමභ්‍රාන්තම්"** යනුවෙන් බෞද්ධ න්‍යාය වාදීහු ප්‍රත්‍යක්ෂය හැඳින්වූහ. **මිරිඟුව** වැනි දේ ඉන්‍ද්‍රිය සන්නිකර්ෂය නිසා පෙනෙතත් එය සැබෑ නොවේ. වේගයෙන් කරකවන **ගිනි පෙනෙල්ලක්** ගිනිවලල්ලක් ලෙස පෙනුනත් එය සැබෑවූවක් නොවේ. ඒ අනුව බෞද්ධ ප්‍රත්‍යක්ෂ විවරණය වඩාත් තර්කානුකූල ය.

**අනුමිති –** අනුමානය නිසා ඇතිවන ඥානය හෙවත් අනුමාන නමින් හැඳින්වෙන හේතුවේ ඵල ඥානයයි. ඒ අනුව අනුමානය හේතුවයි. අනුමිතිය ඵලයයි. ලිංග පරාමර්ශණය හෙවත් හේතුවේ දැක්ම නිසා අනුමානය ද එම අනුමානය නිසා අනුමිතිය ද ඇති වේ.

**උපමිති –** උපමිතිය යනු සාදෘශ්‍ය ඥානය හෙවත් උපමානය (සමාන කර බැලීම) නිසා ඇතිවන ඥානයයි. එවිට සමාන කර බැලීම උපමානයයි. ඒ අනුව ලබන අවබෝධය උපමිතියයි.

**ශාබ්ද –** ශාබ්ද යනු ශබ්දය නිසා ඇතිවන අවබෝධයයි. ශාබ්දය ඵලයයි. එයට අසාධාරණ කාරණය හෙවත් කරණය වූයේ සමාන කර බැලීමයි. බෞද්ධ න්‍යායවාදීහු මෙය ද අනුමානයටම ඇතුළත් කරති. මෙම කරණයට **'ප්‍රමාණ'** යන නමත් ඵලයට **'ප්‍රමා'** යන නමත් ව්‍යවහාර කෙරේ. මේ අනුව ප්‍රත්‍යක්ෂ, අනුමාන, උපමිති, ශාබ්ද යනු ප්‍රමා ඥාන සතරෙහි අසාධාරණ කාරණ හෙවත් කරණ වශයෙන් ඇතිවන හේතුඥාන ලෙස ප්‍රත්‍යක්ෂ, අනුමාන, උපමාන, ශාබ්ද යන හතර හැඳින්වේ. **"ප්‍රමායාඃ කරණම් ප්‍රමාණම් ප්‍රමීයතෙ පරිච්ඡිද්‍යතෙ අනෙනාති ප්‍රමාණම්"** යනුවෙන් ටීකාවෙහි දැක්වේ. මෙහිදී යම්කිසි ඵලඥානයක් ඉපදීමේදී අවශ්‍යවන ඵලයට ඉතාම සමීප වූ අවශ්‍යම කාරණය මෙහි කරණ යනුවෙන් හැඳින්වේ.

අයථාර්ථානුභවයේ සංශය යනු වස්තුව කෙරෙහි නිශ්චයාත්මක ඥානයක් නොවීමයි. 'විපර්යය' යනු වැරදි අවබෝධයයි, භ්‍රමයයි. 'තර්ක' යනු වරදවා තේරුම් ගත් මතයෙහිම එල්බී එය තහවුරු කිරීමට කරුණු ගෙනහැර දැක්වීමයි.

## කරණ-කාරණ-කාර්ය්‍ය

### කරණ

තර්කයේ බුද්ධිය පිළිබඳ විග්‍රහයේදී යථාත්ථානුභවය-**ප්‍රත්‍යක්ෂ, අනුමිති, උපමිති, ශාබ්ද** යයි ඵල වශයෙන් හතරකුත් එම හතරෙහි අසාධාරණ කාරණය හෙවත් කරණය වශයෙන් **ප්‍රත්‍යක්ෂ, අනුමාන, උපමාන, ශබ්ද** යැයි ප්‍රමාණ හතරක් වන බවත් දැක්වේ. කරණයට ප්‍රමාණ යැයි ද නමකි. **"ප්‍රමීයතෙ පරිච්ඡිද්‍යතෙ අනෙනාති ප්‍රමාණම් -ප්‍රමායාඃ කාරණං ප්‍රමාණම්"** යනුවෙන් ටීකාවෙහි දැක්වේ. ඒ අනුව ප්‍රමාව ඵලයයි. ප්‍රමාණය හෙවත් ආසන්න කාරණය හේතුවයි. යම්කිසිවක ඵලයක් ඉපදවීමේදී අවශ්‍යවන හේතු තුනෙන් (කරණ, ව්‍යාපාරය, ඵලය) ප්‍රධානතම හේතුව කරණය යැයි දැක්විණ. ඒ අනුව අසාධාරණ කාරණය කරණයයි. යම්කිසි හේතුවක් නිසා ඇතිවන ඵලයකදී ඒකාන්තයෙන්ම අවශ්‍යතම වූ ඵලයට ආසන්නම වූ කාරණයයි. කරණයෙන් ඇතිවන ක්‍රියාව හෙවත් ව්‍යාපාරය අවසන්වනුයේ ඵලයක් ඉපදවීමෙනි. **මැටි බඳුනක්** පිළිබඳ නිදසුනකදී මැටිබඳුන සකස්වන **කුඹල්සක** මැටිබඳුනේ කරණයයි, හෙවත් අවශ්‍යම වූ ආසන්නවූම හේතුවයි. **කුඹල්සක කරකැවීම** ව්‍යාපාරයයි. **කුඹල්සකත් ව්‍යාපාරයත්** නිසා ඇතිවන මැටිබඳුන කාර්ය්‍යයයි, ඵලයයි. ඒ අනුව හේතුවත් ඵලයත් අතර ඇතිවන ක්‍රියාව ව්‍යාපාර නමින් හැඳින්වේ.

### කාරණ

යම්කිසි ඵලයක් ලැබීමේදී නියත වශයෙන්ම තිබිය යුතු හේතුව කාරණ නමින් දක්වේ. මැටි බඳුනකදී බඳුන කාර්‍ය්‍ය නම් මැටි එහි කාරණය යැයි දක්වේ. එම කාරණය ද යළිත්

1. සමවායී කාරණ 2. අසමවායී කාරණ 3. නිමිත්ත කාරණ

යැයි කොටස් තුණකට බෙදේ. **'සමවායී කාරණය'** යනු නිත්‍ය සම්බන්ධ හේතුවයි. එයින් තොරව කාර්‍ය්‍ය සිදු නොවේ. යම්කිසි වස්තුවක් නිපදවීමේදී එය තැනීමට නිත්‍ය වශයෙන්ම සම්බන්ධවන **'නූල්'** සමවායී කාරණයයි. **'අසමවායී කාරණය'** යනු කාර්‍ය්‍යය සමග හෝ වේවා කාරණය සමග හෝ වේවා සම්බන්ධ වීමේදී එයින් එක්වස්තුවක්ම ඇසුරුකොට පවත්නා කාරණයයි. **වස්ත්‍රය** කාර්‍ය්‍ය නම් එය වියූ නූල් සමවායී කාරණය නම්. **'අසමවායී කාරණය'** වනුයේ එම නූල්වල සංයෝගවීමයි; ගැටීමයි.

### නිමිත්තකාරණය

යම්කිසි කාර්‍ය්‍යයකදී ඉහත සඳහන් කළ කාරණා දෙකෙන් වෙන්වූ වෙනත් බොහෝ කාරණා ය. වස්ත්‍රය කාර්‍ය්‍ය නම් නූල් සමවායී කාරණය නම්. නූල්වල සංයෝගය අසමවායී කාරණය නම්. **නිමිත්ත කාරණය වනුවෙන් එම වස්ත්‍රය තැනීමට අවශ්‍ය වන වෙනත් බොහෝ කාරණා වූ එතෙන්නාවූ උපකරණය (නවාඩ) අනිත් එහා මෙයා කරණ උපකරණය (අලුව) රෝද ක්‍රියාත්මක වන්නා ආදී වෙනත් හේතුයි.** මේ විස්තරවලින් අනුමත වූයේ කරණ, කාරණ, කාර්‍ය්‍ය තුනෙන් ඒකාන්තයෙන්ම ඵලයක් ගෙනදීමට බැඳී සිටින යම් ඒ ආසන්නතමවූ අසාධාරණ කාරණයක් වේ නම් එය කරණය යැයි පෙන්වාදීමය.

### කාර්‍ය්‍ය

පෙර නොතිබුණු යන අභාවයට විරුද්ධ වූ භාවය හෙවත් අස්තිත්වය කාර්‍ය්‍යයයි. ඉහත සඳහන් කරණ-කාරණ දෙකෙහි ප්‍රතිඵලය හෙවත් නිෂ්පාදනය කාර්‍ය්‍යයයි. කරණ-කාරණ දෙකෙන්ම අපේක්ෂා කරනුයේ යම් දෙයක භාවාත්මක පලයයි, හෙවත් කාර්‍ය්‍යයයි.

## නිර්විකල්ප-සවිකල්ප

### නිර්විකල්ප ඥානය

නිර්විකල්ප අවිනිශ්චිත වූ ප්‍රකාර රහිත ඥානයයි. යම් දෙයක් දකීමේදී අවිනිශ්චිතව උපදින්නකි. **"විශෙෂණ විශෙෂ්‍ය සම්බන්ධාවිෂයකං ඥානං නිර්විකල්පම්"** යනුවෙන් එය තීරණාත්මකව උපදින්නකැයි දක්වේ. ඇසට රූපයක් හමුවීමත් සමගම ඇතිවන මූලික හැඳින ගැනීමයි. ඒ අනුව වස්තුවෙහි නියම තත්ත්වය දත නොහැකිය. මිනිසෙක්, සතෙක්, භාණ්ඩයක් වැනි හැඟීමක් පමණක් එයින් ඇතිවේ.

### සවිකල්ප ඥානය

සවිකල්ප ඥානය යනු **"නාමජාත්‍යාදිවිශෙෂණසම්බන්ධවිෂයකං ඥානං සවිකල්පම්"** යනුවෙන් නිර්විකල්පයට අනතුරුව උපදින විනිශ්චයාත්මක ඥානය දක්වේ. එය ප්‍රකාර සහිතයි. මෙය අසවල් වස්තුවකි,මේ අසවලාය ආදී වශයෙන් යථාතත්වය දැනීමයි. ඔහු බමුණෙකි එසේම ඔහු කළුය ආදී වශයෙන් නාම, ජාති, ගුණ යනාදි කරුණු සලකා තීරණාත්මකව උපදින්නකි. ඒ සඳහා විශේෂණ, විශෙෂ්‍ය හා සමවාය යන කරුණු තුන උපකාරී වේ. බෞද්ධ මතයේදී මේ දෙකම ප්‍රමාණ ලෙස නොසැලකේ.

**සන්නිකර්ෂ**

ප්‍රත්‍යක්ෂ ඥානයට හේතුවූ ඉන්ද්‍රියයත් අරමුණුත් අතර ඇතිවන සම්බන්ධය සන්නිකර්ෂයයි. එබඳු සන්නිකර්ෂ 6 කි. **"ද්‍රව්‍යමාත්‍රප්‍රත්‍යක්ෂෙ සච් සංයෝගඃ සන්නිකර්ෂඃ"**

*1. සංයෝග සන්නිකර්ෂ*

*2. සංයුක්ත සමවාය සන්නිකර්ෂ*

*3. සංයුක්ත සමවේත සමවාය සන්නිකර්ෂ*

*4. සමවාය සන්නිකර්ෂ*

*5. සමවෙත සමවාය සන්නිකර්ෂ*

*6. විශේෂණ විශේෂ්‍යාභාව සන්නිකර්ෂ*

**1. සංයෝග සන්නිකර්ෂ** - ඇස හා රූප යන ද්‍රව්‍ය දෙකෙහි පළමුවන මුණගැසීම යි. මෙය චිත්ත වීථියකදී චක්ඛුවිඤ්ඤාණ ස්ථානයයි. මෙය ද්‍රව්‍ය දෙකක් අතර ඇතිවන සංයෝගයකි.

**2. සංයුක්ත සමවාය සන්නිකර්ෂ** - ඇසට නම් රූපය සම්බන්ධව ඇති තතු අවබෝධ කර ගැනීමයි. මෙය චිත්තවීථියෙහි සංතීරණ ස්ථානයයි.

**3. සංයුක්ත සමවෙත සමවාය සන්නිකර්ෂ** - රූපය පිළිබඳ ස්වරූපය හිතෙහි තහවුරු වීමයි. (රූප, ශබ්ද, ගන්ධ) චිත්තවීථියෙහි වොත්තපන අවස්ථාව මෙනි.

**4. සමවාය සන්නිකර්ෂ** - අරමුණ ඉන්ද්‍රිය හා එකිනෙකට ගැටීමෙන් පසු ඇතිවන ස්වභාවයයි. කන කරණ කොට ගෙන ශබ්දය ඇසීම මෙනි. ශ්‍රෝත්‍රය ආකාශාත්මකය. ශබ්දය එහි පිහිටි ගුණයකි. එහෙයින් ගුණී වූ ආකාශයෙහි ගුණය වූ ශබ්දය ඇතිවනුයේ එහි සම්බන්ධය නිසා ය.

**5. සමවෙත සමවාය** - අසන ලද ශබ්දය මේ අසවලාගේ හඬ යැයි අවබෝධ කර ගැනීමට හැකිවන පරිදි අසනු ලැබීමයි.

**6. විශෙෂණ විශෙෂ්‍යාභාව සන්නිකර්ෂ** - යමක් තිබී එය ඉවත් වූ කල එය මෙහි නැත යන අභාවය ප්‍රත්‍යක්ෂ වීමේ සන්නිකර්ෂයයි. මෙය කළය නැති බිමකි. මෙහි බිමට කළය විශේෂණය වේ. බිම විශේෂ්‍ය වෙයි. අභාවය ප්‍රත්‍යක්ෂය කිරීමේදී විශේෂණ හා විශේෂ්‍ය යන දෙකෙහි අභාවය මෙයින් ගැනේ.

මේ ෂට් සන්නිකර්ෂයෙන් උසස් ඥානය ප්‍රත්‍යක්ෂ ඥානයයි. ඊට කරණය වූයේ ඉන්ද්‍රියයි. එබැවින් ඉන්ද්‍රියය ප්‍රත්‍යක්ෂයෙහි ප්‍රමාණය බැව් කියැවිණ. මේ සන්නිකර්ෂ හයෙන් මුල් පහ භාව ප්‍රත්‍යක්ෂ ලෙසත්, 6 වැන්න අභාව ප්‍රත්‍යක්ෂය ලෙසත් වෙන් වේ. මෙහිදී අභාව ඥානය 'අනුපලබ්ධිය' නම් ප්‍රමාණයක් මගින් එකොළොස් වැදෑරුම් කොට බෞද්ධ ප්‍රමාණවාදීහු දක්වූහ. එම අනුපලබ්ධිය න්‍යාය-වෛශේෂිකයෝ පිළිනොගනිති. ඒ වෙනුවට ඔව්හු මෙම විශේෂණ විශෙෂ්‍යතාව සන්නිකර්ෂය දක්වති.

**අනුමානය**

**"අනුමිතිකරණමනුමානම්"** අනුමිති ඥානයට කරණය වූයේ අනුමාණයයි. එම ඥානය ලැබීමට ආසන්න කාරණය වූයේ අනුමානය යැයි දක්වේ. අනුමිතිය යනු එම ඥානයකි. අනුමානයෙන් කෙරෙනුයේ ඉන්ද්‍රිය ගෝචර නොවූ දෙයක් මේ වැනි යැයි මැන ගැනීමයි. යම්කිසි සම්මත නොවූ නියමයක් හෝ න්‍යායයක් හෝ සම්මුතියක් අනුව කලින් ඉන්ද්‍රිය ගෝචර වූ වස්තුවක් දෙස බැලූ යම්කිසිවෙකු විසින් පසුව ඉන්ද්‍රිය ගෝචර නොවූ වස්තුවක ස්වභාවය මේ වැනියැයි මැන ගැනීම මෙයින් අදහස් කෙරේ. එම මැන ගැනීමෙන් අනතුරුව බැසගන්නා නිගමනය අනුමිති ඥානයයි. මෙය යථාර්ථ ඥානයකි. මෙම අනුමිති ඥානය ඇතිවීමට **I. ව්‍යාප්තිය II. ව්‍යාප්‍යය IV. පක්ෂධර්මතාව V. පරාමර්ශය**

යන කරුණු හතරක් අවශ්‍ය වේ. එයින් **'ව්‍යාප්තිය'** යනු සම්මත වූ පොදු නියමයයි. **දුම් ඇති තැන ගිනි ඇතැයි** යන නිගමනය මෙනි. **'ව්‍යාප්‍යය'** යනු සම්මත පොදු නියමයයි, පවත්නා තැනයි. කන්ද මෙනි. **'පක්ෂධර්මතාව'** යනු අපේක්ෂිත ස්ථානයෙහි (**ව්‍යාප්‍යස්‍ය පර්වතාදි වෘත්තිත්වං පක්ෂධර්මතා**) කලින් සඳහන් කළ නියමය පැවතීමයි. මේ නිදසුනේ කන්දේ දුම දක්නට තිබීම මෙනි. **'පරාමර්ශය'** යනු සම්මත නියමය අපේක්ෂිත ස්ථානයෙහි පවතී යයි දැනීමයි. (**වහ්නි ව්‍යාප්‍ය ධූමවානයං පර්වත' ඉති ඥානං පරාමර්ශඃ**) කන්දේ ගිනි ඇති බව දැන ගැනීම මෙනි. මෙම පරාමර්ශයෙන් හෙවත් හේතු ඥානයෙන් පසු ඇතිවන නිශ්චිත නිගමනය **(තජ්ජන්‍යං 'පර්වතො වහ්නිමාන්' ඉති ඥානමනුමිතිඃ**) අනුමිතියයි. මෙම විස්තරය අනුව ව්‍යාප්ති ඥානයක් ඇතිවනුයේ ව්‍යාප්‍ය, ව්‍යාපක හෙවත් හේතු සාධ්‍ය දෙකෙහි එක්ව පවත්නා සම්බන්ධය නිසයි. ඒ අනුව ඒකාන්ත වශයෙන්ම එම දෙකෙහි එක්ව පැවතීම ව්‍යාප්තියක ලක්ෂණයයි. මෙහිදී අවධාරණය කරණ ලද්දේ හේතුව සමග සාධ්‍යය නියත වශයෙන්ම සම්බන්ධ වී තිබීම අත්‍යවශ්‍ය බවයි. මෙහිදී යම්කිසි නිගමනයක් පක්ෂ, සපක්ෂ, විපක්ෂ යන තුනෙන්ම තහවුරු විය යුතුයි. එයින් පක්ෂයෙහි පැවැත්ම යනු සාධ්‍යයට ඇසුරු වූ ස්ථානයයි. දැක්වූ නිදසුනේ කන්ද මෙනි. සපක්ෂයෙහි පැවැත්ම යනු සිද්ධ කළ යුත්ත ප්‍රත්‍යක්ෂ වූ ස්ථානයයි. දැක්වූ නිදසුනේ කුස්සිය මෙනි. විපක්ෂයෙහි නොපැවැත්ම යනු සිද්ධකළ යුත්ත ඊට විරුද්ධ දෙයක කෙසේවත් නොපැවැත්ම මෙනි. මෙහි ගින්න ජලාශයෙහි නැත්තාක් මෙනි. මෙහිදී පක්ෂ-සපක්ෂ දෙකක් ඇති බැව් ඔප්පු වනුයේ විපක්ෂයක් ද ඇති බැවිනි. එබැවින් විපක්ෂය ද යමක් තහවුරු කිරීමේදී අවශ්‍ය යන බැව් කියන ලදී. මේ අනුව අනුමානයට තුඩුදුන් කරුණු අපේක්ෂිත ස්ථානයෙහි පැවතීම නිසා ඇතිවන ඥානය පක්ෂධර්මතා ඥානයයි. අනතුරුව අනුමිති ඥානය ඇති වේ. තර්ක සංග්‍රහය අනුව අනුමානයෙහි භේද දෙකකි.

1. ස්වාර්ථානුමානය 2. පරාර්ථානුමානය යනුවෙනි. (**අනුමානම් ද්විධම්, ස්වාර්ථ පරාර්ථභේදෙති.**)

**01. ස්වාර්ථානුමානය (තත්‍ර ස්වාර්ථං ස්වානුමිති හේතුඃ.** යථා හි ස්වයමෙව භූයො දර්ශනෙන 'යත්‍ර ධූමස්තත්‍රාග්නිරි'ති මහානසාදෞ ව්‍යාප්තිං ගෘහීත්වා, පර්වතසමීපං ගතඃ තද්ගතෙ චග්නෞ සන්දිහානඃ පර්වතෙ ධූමං පශ්‍යන් ව්‍යාප්තිං ස්මරති.)යනු යම් තර්කයක් තමන්ටම අවබෝධ වීමයි. තමන්ට පලපුරුදු ව්‍යාප්තියක් අනුව ඵලය නොදැනම හේතුව පමණක් දැන ඒ අනුව ඵලය දැන ගැනීමයි. තමන් ඒ අයුරින් යම් තර්කයක් අවබෝධ වීමේදී අවයව තුණක් හෙවත් අඞ්ග තුනක් අවශ්‍ය බැව් කියන ලදී. එනම්, **1. හේතු 2. උදාහරණ 3. නිගමන** යන තුණයි. ස්වාර්ථානුමානය තමන්ටම වැටහෙන්නක් බැවින් එය ඥානාත්මක වූවකි. යම් දෙයක් නැවතත් දැකීම හේතු කොට ගෙන යමෙකුට කලින් දැක පලපුරුදු ව්‍යාප්තිය හෙවත් සම්මතය සිහියට ඒ ඒ අනුව ඔහුට අනුමානයකුත් ඊට අනතුරුව අනුමිතියකුත් ඇතිවේ. පර්වතයෙන් දුමක් නඟිනු දුටු කෙනෙකුට ඊට පෙර කුස්සියේදී දුමත් ගිනිත් එකතුව පැවති බව සිහියට එයි. ඒ අනුව ඔහු කන්දෙහි ගිනි ඇති බව තීරණය කරයි. මෙහිදී දුම් දැකීමේ හේතුවත් කුස්සියේ එය ප්‍රත්‍යක්ෂයෙන් දැක ඇති උදාහරණයත් අවසානයෙහි කන්දෙහි දුම් ඇතැයි කළ නිගමනයත් යන තුණම අවශ්‍ය බව පෙන්වා දෙයි. මේ අවයව තුනෙන් ස්වාර්ථානුමානයක් ඇතිවීමේදී ඔහුට හේතු-සාධ්‍ය දෙකෙහි එක්ව පැවතීමේ නියමය වූ යාගචයෂ් නියමයත් කලින් දුටු දේ සිහියට නඟා ගැනීම නම් වූ ස්මෘති රූපයත් ඒකාන්තයෙන්ම තමන්ට ඵලයක් ගෙන දීමේ ව්‍යාපාරය වූ පරාමර්ශයත් අනුමානයෙන් ලැබෙන ඵලය වූ ස්වාර්ථානුමානයත් යන කරුණු සතරක සම්පූර්ණ වීමක් ලැබෙන බැව් කියන ලදී.

**02. පරාර්ථානුමානය** (**යත්තු ස්වයං ධූමාග්නි මනුමාය පර ප්‍රතිපත්‍යර්ථං පඤ්චාවයව වාක්‍යං ප්‍රයුඞ්ක්තෙ තත් පරාර්ථානුමානං.**) ඉහත සඳහන් කරුණු සම්පූර්ණ වී ස්වාර්ථානුමානයක් ලත් කෙනෙකු එම අවබෝධය තවත් කෙනෙකුට හැඟවීම පිණිස කියනු ලබන අවයව පහකින් යුතු වාක්‍යය පරාර්ථානුමානය යි. එය වාග්ශක්තියෙන් කරන්නක් බැවින් පරාර්ථානුමානය ශබ්දාත්මක වේ. ඵල නොදැකම හේතුව පමණක් දැක ඵලය නිශ්චය කිරීම මේ ස්වාර්ථ-පරාර්ථ දෙකෙන්ම සිදුවන බැවින් අනුමානය නම් එකක්ම වෙයි. එසේම ඒ දෙකම යථාර්ථානුමානයන්ම වෙයි. මෙහිදී පරාර්ථානුමානයට **1. ප්‍රතිඥා 2. හේතු 3. උදාහරණ 4. උපනය 5. නිගමන (ප්‍රතිඥා-හෙතු'දාහරණොපනය නිගමනානි පඤ්චාවයවාඃ)** යන අවයව පමණක් අවශ්‍ය බැව් වෛශේෂික මතයයි. න්‍යායවාදීහු මේ පහ ස්වාර්ථ-පරාර්ථ දෙකටම අවශ්‍ය බැව් කීහ. එහෙත් මේ අවයව 5 විග්‍රහ කර බලන විට තර්කයකට නැතිවම බැරි අවයව දෙක වූ හේතු-නිගමනය (සාධ්‍යය) යන දෙක හැරුණු විට ඉතිරි **ප්‍රතිඥා, උදාහරණ, උපනය** යන තුන අදාළ නොවන බැව් විචාරක මතයයි. බෞද්ධ මතය හේතු-සාධ්‍ය දෙක පමණි. යුරෝපීය මතයට හේතු-නිගමනය දෙක පමණි.

## පඤ්චාවයවයට නිදසුනක් බෙදෙන ආකාරය

| | | | |
|---|---|---|---|
| ප්‍රතිඥා | - පර්වතොවහ්නිමාන් | - පර්වතය ගිනි සහිතය. | ('පර්වතො වහ්නිමාන්' ඉති ප්‍රතිඥා) |
| හේතු | - ධූමවත්වාත් | - දුම් ඇති හෙයිනි. | ('ධූමත්ත්වාත්' ඉති හේතුඃ) |
| උදාහරණ | - යථා මහානසඃ | - කුස්සියේ මෙනි. | ('යථා මහානසම්' ඉති උදාහරණම්) |
| උපනය | - තථාචායං | - මෙය ද එසේම ය. | ('තථාචායම්' ඉත්‍යුපනයඃ) |
| නිගමන | - තස්මාත් තථා | - එහෙයින් එසේය. | ('තස්මාත් තථා' ඉති නිගමනම්) |

මේ අනුව අනෙක් තැනැත්තා පර්වතයෙහි ගිනි ඇති බැව් අවබෝධ කර ගැනීම පරාර්ථානුමානයයි.

**ලිඞ්ග පරාමර්ශය –** ස්වාර්ථ, පරාර්ථ අනුමිති දෙකටම කරණය හෙවත් ආසන්න කාරණය වනුයේ ලිඞ්ග පරාමර්ශය (ලක්‍ෂණය පරාමර්ශනය කිරීම) හෙවත් හේතු ඥානයයි (**ස්වාර්ථානුමිති පරාර්ථානුමිතිත්‍යෝර් ලිංගපරාමර්ශ එව කරණම්**). ඒ අනුව හේතු ඥානය අනුමාන නම් වේ. මෙසේ දක්වූ යම්කිසි අනුමානයක් පළමුව සපක්‍ෂයෙහි හෙවත් උදාහරණයෙහි පැවතීමත් දෙවනුව පක්‍ෂයෙහි හෙවත් අපේක්ෂිත ස්ථානයෙහි පැවතීමත් තෙවනුව විපක්‍ෂයෙහි නොපැවතීමත් අනුව මනසට දැනීම ලැබෙයි. මෙහි දක්වූ ලිඞ්ග පරාමර්ශය යනු ඉන්ද්‍රිය ගෝචර ඥානය නොව මනසට දැනීමෙන් වන ඥානයයි (**තස්මාල්ලිංගපරාමර්ශෝනුමානම්**).

තර්කයෙහි එන ත්‍රිවිධ ලිඞ්ගය -යම්කිසි අනුමානයක් ඇතිවීමේ හේතුව ලිඞ්ග යැයි කියනු ලැබේ. එබඳු ලිඞ්ග තුනකි. එනම්,

1. අන්වයව්‍යතිරේකී ලිඞ්ගය

2. කේවලාන්වයී ලිඞ්ගය

3. කේවල ව්‍යතිරේකී ලිඞ්ගය

**"ව්‍යාප්තිබලෙන ලීනමර්ථං ගමයතීති ලිඞ්ගම්"** යනුවෙන් ව්‍යාප්තියක මාර්ගයෙන් සැඟවුනු අර්ථය අවබෝධ කරනුයේ ලිඞ්ගය යැයි ටීකාවේ දක්වේ.

**01. අන්වය ව්‍යතිරේකී ලිඞ්ගය –** (අන්වයෙන ව්‍යතිරේකෙන ච ව්‍යාප්තිමදන්වයව්‍යතිරේකී.) මෙහි අන්වය යනුවෙන් කියන ලද්දේ **"සාධ්‍යසාධණයොඃ සාහචර්‍යමන්වයම්"** යනුවෙන් යම්කිසි හේතුවක් සාධ්‍යයෙහිදී භාව සම්බන්ධයෙන් බැඳී තිබීමයි. (**අන්වය** නම් තිබේ නම් තිබේ යන්නයි. **ව්‍යතිරේකී** නම් නැතිනම් නැත යන්නයි. උදා- ගිනි තිබේ නම් දුම් තිබේ. ගිනි නැතිනම් දුම්නැත.) සත්තාව, භාවය, විද්‍යමානත්වය යන තේරුම් අන්වය යන වචනයට යෙදිය හැකිය. ව්‍යතිරේකී යනුවෙන් කියන ලද්දේ යම්කිසි හේතුවක් සාධ්‍යයෙහිදි අභාව සම්බන්ධයෙන් බැඳී තිබීමයි. **"සාධනාභාව හේත්වාභාවයොඃ සාහචර්‍යම් ව්‍යතිරේකඃ"** ව්‍යතිරේකී යන වචනයට අසත්තාව, අභාවය, අවිද්‍යමානත්වය යන තේරුම් ද යෙදේ. මේ අනුව මේ වචන දෙකම එක්කොට ගත් කල්හි අන්වයව්‍යතිරේකී ලිඞ්ගය යනු යම්කිසි හේතුවක් සාධ්‍යයේදී භාව-අභාව දෙවිධියෙන්ම සම්බන්ධ වී තිබීම හෙවත් සපක්‍ෂ-විපක්‍ෂ දෙකින්ම යම් හේතුවක් බාධාවක් නැතිව ඔප්පු කළ හැකි වීමයි. මෙහි දක්වූ නිදසුන අන්වය සම්බන්ධය අනුව නම් කුස්සියෙහි විද්‍යමාන වන දුම මෙන් දුම් ඇති හැමතැනම අනුව නම් ජලාශයෙහි දුම් අවිද්‍යමාන වන්නාක් මෙන්ම ගිනි නැති තැන දුම් ද නැත යනුවෙනි. මේ අනුව භාව-අභාව දෙකින්ම බැඳුනු විට පර්වතයෙහි ගිනි තිබේ. ගිනි නැති තැන දුම් ද නැත. ජලාශයෙහි මෙනි. (**යත්‍ර වහ්නිර් නාස්ති තත්‍ර ධූමොපි නාස්ති. යථා– මහාහ්‍රද' ඉති ව්‍යතිරෙක ව්‍යාප්තිඃ**)

## 02. කේවලාන්වයී ලිඞ්ගය

භාව සම්බන්ධයෙන් පමණක් සාධනය සමග බැඳුනු හේතුවයි. ඒ අනුව මෙහි දක්වා ඇති නිදසුනෙහි ඇත්තේ පක්ෂය පමණි. **"කළය නමකින් යුත්තය. බුද්ධියට ගෝචර වන හෙයිනි. වස්ත්‍රය මෙනි."** (**අන්වය මාත්‍ර ව්‍යාප්තිකං කෙවලාන්වයී.** යථා-'ඝටොභිධෙයඃ ප්‍රමෙයත්වාත්. පටවත්.' අත්‍ර ප්‍රමෙයත්වා'භිධෙයත්වයොර් ව්‍යතිරේක ව්‍යාප්තිර්නාස්ති. සර්වස්‍යාපි ප්‍රමෙයත්වාද්භිධෙයත්වාච්ච.) (*ප්‍රමෙය යනු අපේ බුද්ධියට අල්ලාගන්න හැකි යනුයි.*) මෙහිදී නමකින් යුතු වීමෙන් බුද්ධිගෝචර වීමෙන් විපක්ෂයක් හෙවත් ව්‍යතිරේකී ව්‍යාප්තියක් නැත. යම් හෙයකින් එය විපක්ෂයට හැරවුවහොත් නමක් නැති දේ බුද්ධිගෝචර නොවන්නක් වේ යැයි කිව යුතුය. එහෙත් නමකින් තොරවූත් බුද්ධි ගෝචර නොවන්නාවූත් කිසිවක් නැති බැවින් එසේ කීමට නොහැකිය. ඒ අනුව මේ නිදසුනේදී හේතුව බැඳී ඇත්තේ අන්වය සම්බන්ධයෙන් පමණි.

**ශ්‍රියාවතී ක්‍රියාවෙන් යුතු තැනැත්තියකි. හැඩරුවට අදින බැවිනි. රූපවතී මෙනි.** මෙහි විපක්ෂයක් ගතහොත් හැඩහුරුවට නො අදින අය ශ්‍රියාවෙන් තොරවූ අය වෙති. එහෙත් එය වැරදි ප්‍රතිඥාවකි. ඒ අනුව මෙහි හේතුව භාව සම්බන්ධයෙන් පමණක් බැඳී තිබේ. අභාව සම්බන්ධයෙන් බැඳී නැත.

**03. කෙවලව්‍යතිරේකී ලිඞ්ගය** (**ව්‍යතිරෙකමාත්‍ර ව්‍යාප්තිකං කෙවලව්‍යතිරෙකී.** යථා-පෘථිවි ඉතරෙභ්‍යො භිද්‍යතෙ, ගන්ධවත්ත්වාත්, යදිතරෙභ්‍යො න භිද්‍යතෙ, න තද්ගන්ධවත්. යථා-ජලම් න චෙයං තථා. තස්මාන් න තථෙ'ති. අත්‍ර යද්ගන්ධවත් තදිතර භින්නමිත්‍යන්වය දෘෂ්ටාන්තො නාස්ති. ප්‍රථිවී මාත්‍රස්‍ය පක්ෂත්වාත්) අභාව සම්බන්ධයෙන් පමණක් සාධ්‍ය සමග බැඳුනු හේතුවයි. ඒ අනුව මෙහි භාව සම්බන්ධයට ඉඩක් නැත. ව්‍යතිරේකයෙන් පමණක් බැඳී ඇති හෙයිනි. පෘථිවිය අනෙක් වස්තූන්ගෙන් වෙනස්ය. ගඳ සහිත හෙයිනි. **"තත්‍ර ගන්ධවතී පෘථිවි"** මේ නිදසුන අනුව ගඳ සහිත දේ අනෙක් දෙකින් වෙනස් දේ යැයි දැක්වීමට භාවාත්මක නිදසුනක් නැත. සපක්ෂයක් නැත. ඊට හේතුව නම් මේ ලක්ෂණයෙන් යුක්ත වනුයේ පෘථුවිය පමණයි. එය මෙවැනි යයි දැක්වීමට කිවයුතු නිදසුනක් නැත.

# හේතු හා හේත්වාභාස

(I. සව්‍යභිචාර, II. විරුද්ධ, III. සපතිපක්ෂ, IV. අසිද්ධ, V. බාධිතාඃ පඤ්ච හෙත්වාභාසාඃ.)

හේතු දෙවැදෑරුම් වේ. **සද්හේතු** (සත්) සහ **අසද්හේතු** (අසත්) වශයෙනි. මෙහිදී ලිඞ්ග වශයෙන් හා අනුමාන වශයෙන් දක්වූවෙත් හේතුන්මය. සද්හේතු යනු **පක්ෂ සත්ව, සපක්ෂ සත්ව හා විපක්ෂ අසත්ව** යන ලක්ෂණ තුනෙන් සම්පූර්ණ වූ හේතුන් ය. අසද්හේතු යනු ඉහත සඳහන් ලක්ෂණ තුනෙන් තොරවූ හේතුන් ය. එවැනි හේතුන්ගෙන් යථාර්ථාවබෝධය නොකෙරේ. මෙම අසද් හේතුන්ටම **'හේත්වාභාස'** හෙවත් **'වැරදි හේතුන්'** යයි කියනු ලැබේ. එබඳු දෝෂ සහිත ප්‍රධාන හේත්වාභාස පහක් දක්වේ. එහි අතුරුභේද සමග 11 කි.

### හේත්වාභාස

**1. සව්‍යභිචාර, 2. විරුද්ධ, 3. සත්ප්‍රතිපක්ෂ, 4. අසිද්ධ, 5. බාධිත,** 6. සාධාරණ, 7. අසාධාරණ, 8. අනුපසංහාරී, 9.ආශ්‍රයානුසිද්ධ, 10. ස්වරූපාසිද්ධ, 11. ව්‍යාප්‍යාත්වාසිද්ධ.

### සව්‍යභචාරී හේත්වාභාසය

'සව්‍යභිචාරී හේත්වාභාසය' යනු පැවැත්මෙන් සපක්ෂ-විපක්ෂ දෙකටම සාධාරණ වූ අසත් හේතුවයි. මෙය අනෛකාන්තිකය හෙවත් නිත්‍ය වශයෙන් පක්ෂාදී එකතැනකට හිමි නොවේ. (**සව්‍යභිචාරො'නෛකාන්තිකඃ**.) මෙයම පක්ෂ-විපක්ෂ දෙකටම සාධාරණ වූ විට සාධාරණ සව්‍යභිචාරී හේත්වාභාසය වශයෙන් ද සපක්ෂ-විපක්ෂ දෙකින්මත් ඉවත්ව පක්ෂයෙහි පමණක් පවත්නා විට අසාධාරණ හේත්වාභාස වශයෙන් ද සපක්ෂ-විපක්ෂ දෙකින්ම ඔප්පුකළ නොහැකි විට **'අනුපසංහාරී'** වශයෙන් ද දක්වේ. (අන්වය ව්‍යතිරෙක දෘෂ්ටාන්ත රහිතො'නුපසංහාරි-යථා සර්වමනිත්‍යං.)

**1. පර්වතය වහ්නිමත්ය. බුද්ධිගෝචර බැවිනි.**

(මෙහි බුද්ධිගෝචර යන්න කුස්සියටත් ජලාශයටත් සාධාරණය.)

**2. ශබ්දය නිත්‍යය. ශබ්දත්වය හෙයිනි.**

(මෙහි ශබ්දත්වය හේතුව පක්ෂයෙහි පමණක් ඇතුළත් වේ.)

**3. සියල්ල අනිත්‍යය ප්‍රමේය වන හෙයිනි.**

### විරුද්ධහේත්වාභාසය

යමක් ඔප්පු කිරීම සඳහා දක්වූ හේතුවකින් ඊට විරුද්ධ දෙයක් ඔප්පු වේ නම් එය විරුද්ධ හේත්වාභාසයකි. ශබ්දය නිත්‍යය **කෘතක** බැවිනි. මෙහිදී නිත්‍යත්වය ඔප්පුකිරීමට දක්වූ හේතුව කෘතකත්වයයි. එයින් ඔප්පු කළ හැක්කේ නිත්‍යත්වය නොව අනිත්‍යත්වයයි. ශරීරය නිත්‍යය බිඳෙන සුලු බැවිනි යන්න මෙනි. (**සාධ්‍යාභාව ව්‍යාප්‍යො හෙතුර් විරුද්ධඃ යථා-ශබ්දො නිත්‍යඃ, කෘතකත්වාදිති)**

### සප්‍රතිපක්ෂ හේත්වාභාසය

යම් හේතුවක් දක්වා සාධ්‍ය ඔප්පු කළ කල්හී තවත් කෙනෙකුට ඊට වෙනස් හේතුවක් දක්වා කලින් ඔප්පු කළ ලක්ෂණයට විරුද්ධ ලක්ෂණයක් කිව හැකි වීම සප්‍රතිපක්ෂ හේත්වාභාසයයි. (**යස්‍ය සාධ්‍යාභාව සාධකං හෙත්වන්තරං විද්‍යතෙ ස සප්‍රතිපක්ෂඃ.** යථා-ශබ්දොනිත්‍යඃ ශ්‍රාවණත්වාච්ඡබ්දත්වත්. ශබ්දො'නිත්‍යඃ, කාර්යත්වාත් ඝටවදිති) ශබ්දය නිත්‍යය ඇසෙන බැවිනි ශබ්දත්වය මෙනි. ශබ්දය අනිත්‍යයය. කෘතක බැවිනි. කල ආදිය මෙනි. මේ නිදසුන් දෙකේදීම පළමු වන නිදසුනේ සාධ්‍ය නිත්‍ය

වේ. දෙවන නිදසුනේ සාධ්‍ය අනිත්‍ය වේ. එවිට එහි පළමුවැන්නේ අභාවයයි. පළමුවැන්න විරුද්ධ පැත්තක් ඇතිව වැරදි සහිත හේතුවක් ඉදිරිපත් කළ බැවින් එසේ විය. තමන් දක්වූ නිදසුන බිඳහෙලා වෙනත් කෙනෙකුට තමන් දක්වූ නිදසුනේම විපක්‍ෂය ඔප්පු කළ හැකි විය.

## අසිද්ධ හේත්වාභාසය

දක්වන ලද නිදසුනේ පක්‍ෂය අවිද්‍යමාන වේ නම් හෙවත් අසිද්ධ වේ නම් එම හේතුව අසිද්ධ හේත්වාභාසයක් වේ. **"යත්‍ර ව්‍යාප්තිං පක්‍ෂධර්මත්වං වා නාස්ති ස අසිද්ධඃ අසිද්ධෙ යත්‍ර හේතොඃ එසඃ ආශ්‍රයසිද්ධඃ"** යනුවෙන් යම් සාධ්‍යයක ව්‍යාප්තිය හෝ පක්‍ෂ ධර්මතාවය හෝ නැති කල්හි එය අසිද්ධ වේ නම් එය ආශ්‍රයාසිද්ධ නම් වේ. දක්වූ දෙය සත්‍ය හා විද්‍යමාන වූවක් නොවේ. **"අහස් පියුම සුවඳවත්ය. පියුමක් බැවිනි. විලේ පියුම් මෙනි."** මෙහි අහස් පියුම යනු පක්‍ෂය හෙවත් ආශ්‍රයයි. එය විද්‍යමාන වූවක් නොවේ. සංකල්පයකි. එබැවින් එය පියුමක් ලෙසත් සුවඳවත් ලෙසත් ඔප්පුකළ නොහැක්කේ විද්‍යමානත්වයක් නැති බැවිනි.

## බාධිත

(**යස්‍ය සාද්ධ්‍යාභාවඃ ප්‍රමාණාන්තරෙණ පක්‍ෂෙ නිශ්චිතඃ ස බාධිතඃ.** යථා-වහ්නිරනුෂ්ණො, ද්‍රව්‍යත්වාදිති.) සාධ්‍ය ඔප්පු කිරීමට දක්වූ හේතුවට එයම බාධා පැමිණවීමයි. **"ගින්න අනුෂ්ණය. ද්‍රව්‍යයක් වූ බැවිනි."** මේ නිදසුන අනුව ද්‍රව්‍යයක් වූ සියල්ලම අනුෂ්ණ ද වේ. එය සිදු නොවන්නකි. මෙහි අනුෂ්ණභාවය දත හැක්කේ ද්‍රව්‍යත්වයෙන් නොවන ස්පර්ශයෙනි. ද්‍රව්‍යත්වයය අන්‍ය ප්‍රමාණයකි. එය දක්වීම සාධ්‍ය ඔප්පු කිරීමට බාධාවක් විය. එබැවින් එය බාධිත හේත්වාභාසයක් වෙයි.